# කඳුකර ප්‍රදේශයන් ආශ්‍රිතව පැවති ගංතුන ග්‍රාමයේ අතීත ස්වාභාවික පරිසරය, ජනප්‍රවාද සහ වර්තමානයේ එම පරිසර පද්ධතිය වෙනස් වී තිබෙන ආකාරය පිළිබඳ පරිසර අධ්‍යයනයක්.

එච්.ඩබ්.එස්. ශෂිකලා ධර්මසේන

## හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ විවිධ ස්වාභාවික පරිසර පද්ධතීන් දක්නට ලැබේ. ඒ අතරින් කඳුකර තෙත් කලාපීය වනාන්තර සුවිශේෂි ස්ථානයක් හිමිකර ගනී. අතීතයේ මෙහි ස්වභාවික පරිසරය තුළ විවිධ වෘක්ෂලතා දක්නට ලැබුණු අතර වර්තමානයේදී මෙම ප්‍රදේශ තේ වගාවට භාවිත කර ඇත. සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගංතුන ග්‍රාමයෙහි පැවති අතීත ස්වාභාවික පරිසරය අධ්‍යයනය කරමින් ඒ හා ගෙතී ඇති ජනප්‍රවාද ඇසුරින් මිනිසාගේ ජීවිතය, අතීතය සහ වර්තමානය තුළ සකස් වී ඇති ආකාරය පිළිබඳ පරිසර පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් කිරීමට මෙමඟින් බලාපොරොත්තු වේ.

## ක්‍රමවේද හා අරමුණු

මෙහිදී පර්යේෂණ ක්‍රමවේද ලෙස ක්ෂේත්‍ර ගවේෂණය, සාහිත්‍ය විමර්ශන හා සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදී. ප්‍රථමයෙන් ගංතුන ග්‍රාමයේ පවතින පාරිසරික සහ ඓතිහාසික පසුබිම සාහිත්‍ය විමර්ශනය තුළින් අධ්‍යයනය කිරීම සිදු කරන ලදී. ඉන් පසුව ප්‍රදේශයේ වෙසෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගෙන් මේ ප්‍රදේශය ආශ්‍රිතව බැඳි ජනප්‍රවාද කතා සහ අතීත විත්ති පිළිබඳ තොරතුරු විමසීමක් සිදුකරන ලදී අපේක්ෂිත අරමුණක් වේ. අතීත ස්වාභාවික පරිසරය වර්තමානය තුළදී වෙනස් වී තිබීම නිසා මිනිසාගේ ජන ජීවිතය වෙනස් වූ ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ.

## ප්‍රතිඵල හා සාකච්ඡා

අධ්‍යයන ප්‍රදේශයේ දේශගුණික ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී වර්තමාන පළාත් මායිම් අනුව ශ්‍රී ලංකාවේ සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්ව ගංතුන ග්‍රාමය අතරමැදි තෙත් කලාපයට අයත් වේ. මෙම ප්‍රදේශයට නිරිත දිග මෝසම් සුළං මඟින් වර්ෂාව ලැබේ. වර්ෂයේ ඉතිරි මාසවල දී සංවහන වැසි නිසා සැලකිය යුතු වර්ෂාපතනයක් ලැබේ (www.meteo.gov.lk). වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය මිලි මීටර් 4000ත් 5000 ත් වන අතර වේ. වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 24-35ත් පරාසය තුළ විවිධ වේ (www.meteo.gov.lk). තෙත් කලාපයට ආවේණික පස් වර්ගයක් වන රතු දුඹුරු ලැටසෝල් පස මෙම ප්‍රදේශයේ බහුලව දක්නට ලැබේ (sinhalasubjects.blogspot.com). මෙම පස තේ, රබර්, කෝපි, කොකෝවා, කරදමුංගු, එනසාල්, කරාබු නැටි සහ පලතුරු වැනි වගාවලට සුදුසුය. කඳුවැටි, කපොලු, නිම්න ආදිය මෙම ප්‍රදේශයේ භූ දර්ශනයේ විශේෂ ලක්ෂණ වේ. ගංතුන ග්‍රාමයේ ස්වභාවිකව පිහිටි ඔයවල්, ඇළවල් සහ ජල උල්පත් මඟින් මෙහි ජලාපවහනය සිදු වේ.

ගංතුන ගම්මානයට පිවිසෙන ප්‍රධාන පිවිසුම් මාර්ග හතරක් ඇත. ඉන් පළමු වැන්න වන්නේ කෑගල්ල, පරගම්මන, හෙට්ටිමුල්ල, මොරොන්තොට, මාබෝපිටිය පසුකරමින් ගංතුනට. දෙ වැනි මාර්ගය වන්නේ දෙබත්ගම සිට කළුගල හරහා අඩිපාර, එසේම අරණායක සිට ගංතුන දක්වා මාර්ගය ද, දොළොස්බාගේ සිට තලපාල හරහා මාර්ගය මඟින් ද ගංතුනට පිවිසිය හැකිය. මෙම මාර්ගවලින් එනවිට ගම ආරම්භයේ අම්බලම් තුනක් සාදා තිබී ඇත. වර්තමානය වන විට එම අම්බලම් විනාශමුඛයට පත්වෙමින් පවතී. පසුකාලීනව එනම්, 1929 දී පමණ කාලයේ දී දැනට ප්‍රධාන මාර්ගය වන අරණායක සිට ගම්තුන දක්වා ඇති මාර්ගය රථවාහන ගමන් කිරිමට හැකි වන පරිදි කපා සකස් කර ඇත. එවකට ඉංග්‍රීසි ආණ්ඩුවේ වතු පාලකයකු වූ බැලැකට් නමින් හැඳින්වූ වතු අධිකාරිවරයා විසින් මෙම

මාර්ගය සෑදීම සඳහා මූලිකව ක්‍රියාකළ බව සඳහන් වේ. (සෝමරත්න,2014:14-15).

මෙම ගම්මානයේ ඓතිහාසිකත්වය අධ්‍යයනය කිරීමේ දී ජනප්‍රවාදයන්ට අනුව වලගම්බා රජ දවස දක්වා ඉතිහාසය දිවෙන්නකි. පැරණි බෙදීම් අනුව සබරගමුව පළාතේ, කඳු අහපත්තුවේ, පරණකුරු කෝරළයට අයත් මෙම ඓතිහාසික ගම්මානය හරහා මහනුවර සිට ගම්පොළ, දොළොස්භාගේ, පට්තලාව, බෙරවිල, තලපාල, හුළංකපොල්ල (මුරුතේ කඩඉම) පසු කරමින් උඩුව රජමහා විහාරයට වලගම්බා රජු ගිය බව සඳහන් වේ (එම,2014:13).

රජු ගිය මෙම මාර්ගය අශ්වයින්ට ගමන් කළ හැකි වන ලෙස සකසා තිබී ඇති අතර එවකට මෙම ගම්මානය ජනාවාසව තිබී ඇති බවට හොරහේන ගල්ලෙන, අම්බලකන්ද ගුරුගල්ලෑව ගල්ලෙන, දම්පැල්ගොඩ ගල්ලෙන තුළින් ද සාක්ෂි විද්‍යාමාන වේ. මෙම ගල්ලෙන්වල කටාර කොටා ඇතුළට ජලය නොයන ලෙස සකසා තිබීමෙන් ඒවා තුළ භික්ෂූන් වහන්සේලා ජීවත් වී ඇති බවට සාක්ෂි දක්නට ලැබේ (එම,2014:13).

උඩගම, පල්ලේගම, බෙලිහුල්වාන යන ගම් ත්‍රිත්වය ඈඳීමෙන් 'ගංතුන' නාමය පටබැඳි ඇති බව ජනප්‍රවාදයන්ට අනුව පැහැදිලි වේ. ඉතා අල්ප වූ පවුල් සංඛ්‍යාවක් ජීවත් වී ඇති මෙහි බළල්ගල කන්ද, කුකුල්පිටිය ගල කන්ද, සාමසර කන්ද, බෝතලා ගල මාළිගාකන්ද, ලේපලාව කන්ද හා උනන්කන්ද යන කඳුවැටිවලින් ගංතුන ග්‍රාමය වට වී තිබේ. මෙම කඳුවැටිවලට නාමයන් පටබැඳි ඇති ආකාරය පිළිබඳව ජනප්‍රවාදයේ විවිධ කතා සමග ගෙතී පවතී. ගෞතම බුදු රජාණන් වහන්සේ යක්ෂයින් දමනයට ප්‍රථම වරට ලක්දිව මහියංගනයට වැඩම වූවායින් පසුව සුමන දිව්‍ය රාජයාණන් බුදු රඳුන් ලක්දිවට වැඩිබව සනාථ කිරීම සඳහා යම් කිසිවක් තබා යන ලෙස ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව බුදු රඳුන්ගේ සිරිපා සලකුණ තැබීමට සුදුසු ස්ථානයක් සොයා යන අතරේ දී බළල්ගල කන්ද මුඳුනට වැඩමකොට සිරිපා සලකුණ තැබීමට සුදානම් වනවිට බළලෙකුගේ කෑගැසීමක් ඇසී එම ස්ථානය නුසුදුසුයි සිතා එම ස්ථානයෙන් නික්මගිය බව එක් ජනප්‍රවාදයක එයි. ඉන්පසුව එම කන්දට 'බළල්ගල කන්ද' යනුවෙන් නම් පටබැඳිනි. එම ස්ථානයෙන් බුදු රඳුන් වෙනත් කන්දක් මුඳුනට පැමිණ සිරිපා සලකුණ තැබීමට සුදානම් වීමේදි කුකුළෙකුගේ හැඬලීමක් ඇසී එම ස්ථානයත් නුසුදුසුයි සිතා වර්තමාන රත්නපුර දිස්ත්‍රික්කයේ සමනොළ කන්ද මුඳුනෙහි සිරිපා සලකුණ තබන ලද බවත් ඒ අනුව කුකුළා හැඬලූ ස්ථානය 'කුකුල්පිටියගල කන්ද' ලෙස ව්‍යවහාර වූ බව ද ජනප්‍රවාදයේ සඳහන් වේ.

ගංතුන ග්‍රාමයේ ජලවහනය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ප්‍රධාන ජල මූලාශ්‍රයක් ලෙස ගුරුගොඩ ඔය පෙන්වාදිය හැකිය. වැලිකඩ ඔය, බටුගොල්ල ඔය, දුම්මල ඇළ, කුඩා ඔය සහ දෝතල් ඔය ආදී කුඩා කුඩා ජල මූලාශ්‍රයන්ගෙන් ගුරුගොඩ ඔය පෝෂණය වේ. ගංතුන ග්‍රාමයෙන් ආරම්භ වන ගුරුගොඩ ඔය ප්‍රදේශ රැසකට පෝෂණය ලබාදෙමින් මොරොන්තොට, රුවන්වැල්ල ආදී ප්‍රදේශයන් පසු කරමින් කැළණි ගඟට එකතු වී අවසාන ගමනාන්තය වන මහමුහුදට එකතු වේ. අතීතයේ දී මෙම ගම්මානයේ ජීවත් වූ සාමාන්‍ය ගැමි ජනතාව හේන් කුඹුරු වගාකර ඔවුන්ගේ ජන ජීවනෝපාය සරිකර ගන්නට ඇත. මෙම ප්‍රදේශය ස්වාභාවික කඳුවැටිවලින් ගහන බැවින් අනුරාධපුර, පොළොන්නරු ප්‍රදේශවල මෙන් තැනිතලා කුඹුරු දක්නට නොලැබේ. දුම්බර කඳුවැටිවල මෙන් හෙල්මළු ක්‍රමයට කුඹුරු සකසා ගොවිතැනෙහි යෙදී ඇත. දෛනික ජීවිතයට අවශ්‍ය කරන මිරිස්, කුරහන්, අල, බතල, මඤ්ඤොක්කා, කැකිරි, දඹල, වැටකොළු, කරවිල, වට්ටක්කා, කහ, ඉඟුරු, කෙසෙල් ආදිය වගා කරමින් හේන් ගොවිතැනෙහි යොමු වී ඇත. ඊට අමතරව පුවක්, සාදික්කා, එනසාල්, ගම්මිරිස් වැනි බෝගයන් වගාකර ඒවායින් පෙති පුවක්, වසාවාසි, සාදික්කා, එනසාල් ලබාගෙන පා ගමනින් මොරොන්තොට පොළට ගෙනගොස් විකුණා මුදල් උපයාගෙන ඇත. එමෙන්ම මෙම ගම්මානයේ තවත් පිරිසක් අරණායක පසු කරමින් මාවනැල්ල පොළට ගෙනගොස් තමන්ට අවශ්‍ය කරන ද්‍රව්‍යය රැගෙන එන්නට ඇත.

ගෙපිල ඉතා උසට සිටින සේ වරිච්චි යොදා මැටියෙන් නිවෙස් සාදාගෙන වහලයට ඉලුක්

හෝ පිදුරු වැනි ස්වාභාවික ද්‍රව්‍යය යොදා සෙවිළි කර තිබේ. එකල මෙහි පදිංචිකරුවන් 10-15ක් අතර ප්‍රමාණයක් සිටින්නට ඇතැයි විශ්වාස කෙරේ. ඉන්පසු ක්‍රමයෙන් ගම්මානයේ පවුල් සංඛ්‍යාව වැඩිවීමක් දක්නට ලැබුණි. හේන් ගොවිතැනට පිරිස යොමුවීමත් සමඟ රාත්‍රී කාලයේදී පුරුෂයින් හේනෙහි පැලක් තනාගෙන පැල් රකින්නට විය. කාන්තාවෝ නිවෙස්වලට වී දරුවන් රැකගෙන ගෙදර දොරේ වැඩපළවල නිරත වී සිටින්නට ඇත. එකල පිරිමින්ගේ ඇඳුම් වී ඇත්තේ අමුඩය සහ හිසේ බඳින කම්බි ලේන්සු කැබැල්ලකි. කාන්තාවෝ රෙද්ද සහ තිසරපටයෙන් නිරුවත වසා තිබේ. එසේම විවාහය සඳහා ගමෙන් පිට නොගිය අතර තම ඥාතී වර්ගයා සමඟ දීග යැම සාමාන්‍ය සිරිත විය. වෛද්‍ය සේවයේ මෙකල නියතුව ඇත්තේ විෂ වෛද්‍ය ඩී. විජ්නාරාම මහතාය. නමුත් උණ හෝ ඊට වඩා වැඩි රෝගයක් වැළඳුන විට උඳුගොඩ වැනි ඈත දුර රෝහලක් වෙත පයින්ම ගමන් කිරීමට සිදුවිය. ගැබිණි මාතාවන් මෙසේ ඈත දුර පළාත්වලට රැගෙනයාම ඉතා දුෂ්කර කාර්යයක් වූ නිසාවෙන් එන්. උක්කු, වී. සිරිමලි සහ එපිට ගෙදර මාතාවන් එම වින්නඹු කටයුත්ත නොපිරිහෙලා ඉටුකර ඇත. කලා කටයුතුවලින් දක්ෂකම් පිරුණු ගැමියන් ද එකල මෙහි වාසය කර ඇත. උඩරට නැටුම් කලාව හා එක් වූ පරගහපිටියේ යද්දෙස්සා, වී. සිරිමලා, ආර්. සියාතුවා යන නැටුම් ශිල්පීන් ද වාදන අංශයෙන් (බෙර වැයීම) වී. අප්පුවා කුකුල්පිටිය මහතා ද විය. එමෙන්ම බලිතොවිල්, කංකාරි පිදුම්, කිඳුරු වැනි පාරම්පරික කලා කටයුතු ද අනවින කොඩිවින, සෙත් ශාන්ති කර්ම ද මේ අතර කරගෙන ගොස් ඇත (එම,2014:16).

ගංතුන ග්‍රාමයේ අතීත පරිසර තත්ත්වය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී මෙහි ශාකායනයට සහ සත්ත්වායනයට ප්‍රධාන තැනක් හිමි වේ. තෙත් කලාපීය පරිසරයන් තුළ දැකිය හැකි පහත දැක්වෙන ශාඛ මෙහි දක්නට ලැබේ. ඇටඹ (*Mangifera zeylanica*), වල්දෙල් (*Artocarpus nobilis*), ගොඩපර (*Dillenia retusa*), හොර (*Dipterocarpus spp*), කළුම්දිරිය (*Semecarpus spp*), බටදොඹ (*Syzygium operculatum*), දියනා (*Mesuq ferrea*), බූ කැන්ද (*Macaranga peltata*), මලබොඩ (*Myristca dactyloides*), කහම්ල්ල (*Vetex pinnata*), කිතුල් (*Cariyota urens*) ,පොල් (*Cocos nucifera*) ,පුවක්, මා වේවැල් (*Calamus thwaitesill*) (චන්ද්‍රානන්ද,2017,81-82). එසේම ලංකාවේ වියළි කලාපීය දේශගුණයේ වැඩි වශයෙන් දක්නට ලැබෙන ශාඛ විශේෂ ද මෙහි තිබේ. ගම්මාලු (*Pterocarpus marsipum*), හල්මිල්ල (*Berrya cordifolia*), හුලංහික් (*Chukrassia velutina*), කර (*Canthium coromandelicum*), කොළොන් (*Adina cordifolia*), කොහොඹ (*Asadirachta indica*), මුගුණ (*Tetrameles nudiflora*, සියඹලා (*Tamarindus Indica*), තෙලඹු (*Sterculia foerida*), වීර (*Drypetes sepiaria*), මොර (*Dimocarpus iongon*), වෙලං (*Pterospermum suberifolium*), කුරටියා (*Phyllanthus polyphyllus*), එරමිණියා (*Ziziphus oenoplia*). ඊට අමතරව අංකෙන්ද (*Acronychia pedunculata*). දවුල් කුරුඳු (*Neolitsea cassia*), යකඩමරං (*Syzygium zeylanicum*) වැනි ශාඛ දක්නට ලැබේ (එම,82-83).

එසේම සිවිය ගස්වන අරළු (*Ficus mollis*), හික් (*Lannea coromandlica*), දළුක් (*Euphorbia antiquorum*), කීන (*Calophylluk spp*), තොළු (*Strofilantus spp*), ජම්බු (*Syaigum spp*), බිනර (*Exacum trinervium*) යන කඳුකරයට ආවේණික ශාඛ ද දැකිය හැකිය (එම,85). මෙහි ඖෂධීය ශාඛ විශාල ප්‍රමාණයක් ඇති අතර ඉන් හඳුනාගත් කිහිපයක් මෙලෙස පෙන්වාදිය හැකිය. නෙල්ලි (*Phyllanthus emblica*), බුලු (*Terminalia belerica*), කොතල හිඹුටු (*Salacia reticulato*) රණවරා (*Cassia auriculata*), මහහැඩයා (*Lycopodium phylgmaria*), වල්නවහන්දි (*Rhipsalis baccifera*), වෙලන්ගිරියා (*Capparis zeylanica*), වනරාජ (*Anoectochlus zizaniodides*), ඉරුරාජ (*Zeuxina regia*), සැවැන්දරා (*Veriveria zizaniodes*), නාගවල්ලි (*Sensevierla zeylanica*), අට්ටික්කා (*Focus racemosa*), ඇත්තෝර (*Cassia alata*), ඇත්දෙමට (*Gmelina arborea*), ඉරමුසු (*Hemi desmus indicus*), ඉරිවේරිය (*Plectranthus zeylanicus*), කරපිංචා (*Murraya koenigii*), කුප්පමේණියා (*Acalypha indica*), ගොටුකොළ (*Centella asiatca l urban*), හාතාවාරිය (*Astaragus racmosus*) (එම;85). ගම්තුන ග්‍රාමයේ

ගස් මෙන්ම විශේෂිත වැල් වර්ග ද දැකිය හැකිය. මේවා ප්‍රමාණයෙන් විශාල ය. ඇතැම් වැල් කටු සහිතය. මේ අතර පුස්වැල්, යකඩවැල්, දිය කිරිඳි වැල් (*Loesenerieella macrantha*) හා ගැරඬිදුල් වැල් (*Cayratia pedata*), ලබුවැල් ආදිය විශේෂයෙන් කැපීපෙනේ (එම;87). පුෂ්ප හට නොගන්නා මෙන්ම බීජ හට නොගන්නා ශාඛ විශේෂ කිහිපයක් ද මෙම ග්‍රාමයේ දක්නට ලැබේ. එනම්, *Pogonatum, Selaginella, Nephrolepis, Salvinia, Acrosticum, Drynaria* වේ.

ගම්තුන සත්ත්ව සන්ගතිය අධ්‍යයනය කිරීමේදී සත්ත්ව විශේෂ කිහිපයක් හඳුනාගැනිමට හැකි වූ අතර ක්ෂීරපායී සත්ත්වයින් අතර ඉත්තෑවා (*Hystrix indica*), උගුඩුවා (*Paradoxurus hermabhroditus*), උනහපුලුවා (*Loris tardigradus*), උරුලෑවා (*Viverricula indica*), ඌරු මීයා (*Bandiota indica*), කලවැද්දා (*Paradoxurus hermabhroditus*), කොළ දිවියා (*Felis viverrina*), කොස්ඇට මීයා (*Mus musculus*), දඬුලේනා (*Ratufa macroura*), මාහම්බාවා (*Petaurista philippensis*) මාවවුලා (*Pteropus giganteus*), මීමින්නා (*Tragulus meminna*), මුගටියා (*Herpestes*), ලේනා (*Funambulus sp*), වල්ඌරා (*Susdomesticus*), වල්හාවා (*Lepus nigricollis*), වැලිමුවා (*Muntiacus muntjak*), හම්බාවා (*Petaurista petaurista*), හෝතඹුවා (*Herpestes edwardsii*) (චන්ද්‍රානන්ද,201:,73-74). උරග වර්ගයට අයත් විෂඝෝර සර්පයින් ද මෙහිදි හඳුනාගන්නට හැකිවිය. ඇහැටුල්ලා (*Ahaetulla nasutus*), කබරගොයා (*Varanus sallvator*), ගැරඬියා (*Ptyas mucosus*), දියබරියා (*Exenochrophis piscater*), නාගයා (*Naja naja*), පලාපොළගා (*Trimeresurus trigonocephalus*), පිඹුරා (*Python molurus*), පොල්මල් කරවලා (*Chrysopeleaornate*), පොළොං තෙලිස්සා (*Hypnale hypnale*), බෝදිළිමා (*Chamaeleo brookesia*), මල්කරවලා (*Balanophis ceylonesis*), හරකුක්කා (*Amphiesma stolata*), හාල්දණ්ඩා (*Dendre iaphis spp*), ගැඩවිලා (*Eudrillus*) (එම;75). ආත්‍රෝපෝඩා ගණයට අයත් සත්ත්වයින් ද හඳුනාගන්නා ලදී. කළු කූඹියා (*Formica nidificans*), දිමියා (*Ocecophylla smaragdina*), මීමැස්සා (*Apis mellifera*), රැහැයියා (*Cicada spp*), රෑ බදුල්ලා (*Lampyris spp*), හරක් කිනිතුල්ලා (*Boophilus annulatus*), හෝ හපුටා (*Culex pipens*) (එම,75). මීට අමතරව ගොළුබෙලි විශේෂ කිහිපයක් ද හඳුනාගැනීමට හැකිවිය. (*Acavus superbus*), (*Paludomus sp*), ( *Achantina fulica*), ( *Aulopoma sp*). ප්‍රධාන ජල මූලාශ්‍රයක් වන ගුරුගොඩ ඔයෙහි කොරලියා (*Etroplus suratensis*), දණ්ඩියා (*Esomus thermoicos*), මඩ කනයා (*Ophiocephalus punctatus*) යන මත්ස්‍යයින් දක්නට ලැබේ (එම,2017,75-76). පක්ෂීන් විශේෂ රාශියක් ද මෙම ප්‍රදේශයෙන් හඳුනාගන්නා ලදී. ඇටි කුකුළා (*Centropus sinensis*) උලමා (*Bubo nipalensis*), කණකොකා (*Ardeola grayii*), කවුඩා (*Dicrurus lophorhinus*), කළුකපුටා (*Corvus macrorhynchos*), කොණ්ඩ කුරුල්ලා (*Pyenonotius cafer*), කොවුලා (*Eudynamys scolopaceus*), දෙමලිච්චා (*Turdoides affinis*), නීලකොබෙයියා (*Chalcophas indica*), පැණි කුරුල්ලා (*Nectarinia lotenia*), මයිනා (*Acridotheres tristis*), ශ්‍රී ලංකා වැහිළිහිණියා (*Hirundo hyperythra*) වවුලා (*Cynopterus ssphinx*), පිළිහුඩුවා (*Halcyon pileata*), කොරවක්කා (*Amaurornis phoenicurus*) (එම,76-77). ඒ අනුව මෙහි ශාක සහ සත්ත්ව ප්‍රජාව අධ්‍යයනය කිරීමේදි විශාල ජෛව විවිධත්වයකින් යුත් පෙදෙසක් ලෙස පෙන්වා දිය හැකිය.

මෙම ගම්මානයේ ජනතාව පරිසරයත් සමඟ ඉතා දැඩි සම්බන්ධතාවයක් පවත්වා ඇත. ඒ අනුව ඔවුන්ගේ වගාවන්ට ස්වාභාවිකව සිදුවන හානි සහ රෝග සඳහා ඔවුන්ටම ආවේණික නාමයන් පාවිච්චි කරනු ලැබේ. කෙසෙල් බෝග වගාවේ දී සිදුවන රෝග සඳහා විවිධ නාමයන් භාවිත කර ඇත. **කහ රෝගය** යනුවෙන් ගොවියා හඳුන්වන්නේ සරුවට වැඩී තිබෙන කෙසෙල් අතුවල කහපාට මතුවෙලා පසුව සම්පූර්ණ ගසම කහපාට වී කෙසෙල් අතු කඩා වැටීමේ රෝගය වේ. එමගින් සම්පූර්ණම කෙසෙල් පඳුරුම විනාශ වේ. කෙසෙල් ගසේ මව් ගහෙන් එන **හොටි මැරීමේ රෝගය** ගැමි ජනතාව විසින් කඳ පණුවා විදීමේ රෝගය ලෙස හඳුන්වනු ලැබේ. එයම කෙසෙල්

හෝ පිදුරු වැනි ස්වාභාවික ද්‍රව්‍යය යොදා සෙවිළි කර තිබේ. එකල මෙහි පදිංචිකරුවන් 10-15ක් අතර ප්‍රමාණයක් සිටින්නට ඇතැයි විශ්වාස කෙරේ. ඉන්පසු ක්‍රමයෙන් ගම්මානයේ පවුල් සංඛ්‍යාව වැඩිවීමක් දක්නට ලැබුණි. හේන් ගොවිතැනට පිරිස යොමුවීමත් සමඟ රාත්‍රි කාලයේදී පුරුෂයින් හේනෙහි පැලක් තනාගෙන පැල් රකින්නට විය. කාන්තාවෝ නිවෙස්වලට වී දරුවන් රැකගෙන ගෙදර දොරේ වැඩපළවල නිරත වී සිටින්නට ඇත. එකල පිරිමින්ගේ ඇඳුම් වී ඇත්තේ අමුඩය සහ හිසේ බඳින කම්බි ලේන්සු කැබැල්ලකි. කාන්තාවෝ රෙද්ද සහ තිසරපටයෙන් නිරුවත වසා තිබේ. එසේම විවාහය සඳහා ගමෙන් පිට නොගිය අතර තම ඥාතී වර්ගයා සමඟ දීග යෑම සාමාන්‍ය සිරිත විය. වෛද්‍ය සේවයේ මෙකල නියතුව ඇත්තේ විෂ වෛද්‍ය ඩී. විජ්නාරාම මහතාය. නමුත් උණ හෝ ඊට වඩා වැඩි රෝගයක් වැළඳුන විට උඳුගොඩ වැනි ඈත දුර රෝහලක් වෙත පයින්ම ගමන් කිරීමට සිදුවිය. ගැබිණි මාතාවන් මෙසේ ඈත දුර පළාත්වලට රැගෙනයාම ඉතා දුෂ්කර කාර්යයක් වූ නිසාවෙන් එන්. උක්කු, වී. සිරිමලි සහ එපිට ගෙදර මාතාවන් එම වින්නඹු කටයුත්ත නොපිරිහෙලා ඉටුකර ඇත. කලා කටයුතුවලින් දක්ෂකම් පිරුණු ගැමියන් ද එකල මෙහි වාසය කර ඇත. උඩරට නැටුම් කලාව හා එක් වූ පරගහපිටියේ යද්දෙස්සා, වී. සිරිමලා, ආර්. සියාතුවා යන නැටුම් ශිල්පීන් ද වාදන අංශයෙන් (බෙර වැයීම) වී. අප්පුවා කුකුල්පිටිය මහතා ද විය. එමෙන්ම බලිතොවිල්, කංකාරි පිදුම්, කිඳුරු වැනි පාරම්පරික කලා කටයුතු ද අනවින කොඩිවින, සෙත් ශාන්ති කර්ම ද මේ අතර කරගෙන ගොස් ඇත (එම,2014:16).

ගංතුන ග්‍රාමයේ අතීත පරිසර තත්ත්වය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී මෙහි ශාකායනයට සහ සත්ත්වායනයට ප්‍රධාන තැනක් හිමි වේ. තෙත් කලාපීය පරිසරයන් තුළ දැකිය හැකි පහත දැක්වෙන ශාඛ මෙහි දක්නට ලැබේ. ඇටඹ (*Mangifera zeylanica*), වල්දෙල් (*Artocarpus nobilis*), ගොඩපර (*Dillenia retusa*), හොර (*Dipterocarpus spp*), කළුමිදිරිය (*Semecarpus spp*), බටදොඹ (*Syzygium operculatum*), දියනා (*Mesuq ferrea*), බූ කැන්ද (*Macaranga peltata*), මලබොඩ (*Myristca dactyloides*), කහමිල්ල (*Vetex pinnata*), කිතුල් (*Cariyota urens*) ,පොල් (*Cocos nucifera*) ,පුවක්, මා වේවැල් (*Calamus thwaitesill*) (චන්ද්‍රානන්ද,2017,81-82). එසේම ලංකාවේ වියළි කලාපීය දේශගුණයේ වැඩි වශයෙන් දක්නට ලැබෙන ශාඛ විශේෂ ද මෙහි තිබේ. ගම්මාලු (*Pterocarpus marsipum*), හල්මිල්ල (*Berrya cordifolia*), හුලංහික් (*Chukrassia velutina*), කර (*Canthium coromandelicum*), කොළොන් (*Adina cordifolia*), කොහොඹ (*Asadirachta indica*), මුගුණ (*Tetrameles nudiflora*, සියඹලා (*Tamarindus Indica*), තෙලඹු (*Sterculia foerida*), වීර (*Drypetes sepiaria*), මොර (*Dimocarpus iongon*), වෙලං (*Pterospermum suberifolium*), කුරටියා (*Phyllanthus polyphyllus*), එරමිණියා (*Ziziphus oenoplia*). ඊට අමතරව අංකෙන්ද (*Acronychia pedunculata*). දවුල් කුරුඳු (*Neolitsea cassia*), යකඩමරං (*Syzygium zeylanicum*) වැනි ශාඛ දක්නට ලැබේ (එම,82-83).

එසේම සිවිය ගස්වන අරළු (*Ficus mollis*), හික් (*Lannea coromandlica*), දළුක් (*Euphorbia antiquorum*), කීන (*Calophylluk spp*), තොළු (*Strofilantus spp*), ජම්බු (*Syaigum spp*), බිනර (*Exacum trinervium*) යන කඳුකරයට ආවේණික ශාඛ ද දැකිය හැකිය (එම,85). මෙහි ඖෂධීය ශාඛ විශාල ප්‍රමාණයක් ඇති අතර ඉන් හඳුනාගත් කිහිපයක් මෙලෙස පෙන්වාදිය හැකිය. නෙල්ලි (*Phyllanthus emblica*), බුලු (*Terminalia belerica*), කොතල හිඹුටු (*Salacia reticulato*) රණවරා (*Cassia auriculata*), මහහැඩයා (*Lycopodium phylgmaria*), වල්නවහන්දි (*Rhipsalis baccifera*), වෙලන්ගිරියා (*Capparis zeylanica*), වනරාජ (*Anoectochlus zizaniodides*), ඉරුරාජ (*Zeuxina regia*), සැවැන්දරා (*Veriveria zizaniodes*), නාගවල්ලි (*Sensevierla zeylanica*), අට්ටික්කා (*Focus racemosa*), ඇත්තෝර (*Cassia alata*), ඇත්දෙමට (*Gmelina arborea*), ඉරමුසු (*Hemi desmus indicus*), ඉරිවේරිය (*Plectranthus zeylanicus*), කරපිංචා (*Murraya koenigii*), කුප්පමේණියා (*Acalypha indica*), ගොටුකොළ (*Centella asiatca l urban*), හාතාවාරිය (*Astaragus racmosus*) (එම;85). ගම්තුන ග්‍රාමයේ

ගස් මෙන්ම විශේෂිත වැල් වර්ග ද දැකිය හැකිය. මේවා ප්‍රමාණයෙන් විශාල ය. ඇතැම් වැල් කටු සහිතය. මේ අතර පුස්වැල්, යකඩවැල්, දිය කිරිඳි වැල් (*Loeseneriella macrantha*) හා ගැරඬිදුල් වැල් (*Cayratia pedata*), ලබුවැල් ආදිය විශේෂයෙන් කැපීපෙනේ (එම;87). පුෂ්ප හට නොගන්නා මෙන්ම බීජ හට නොගන්නා ශාඛ විශේෂ කිහිපයක් ද මෙම ග්‍රාමයේ දක්නට ලැබේ. එනම්, *Pogonatum, Selaginella, Nephrolepis, Salvinia, Acrosticum, Drynaria* වේ.

ගම්තුන සත්ත්ව සන්ගතිය අධ්‍යයනය කිරිමේදී සත්ත්ව විශේෂ කිහිපයක් හඳුනාගැනිමට හැකි වූ අතර ක්ෂීරපායී සත්ත්වයින් අතර ඉත්තෑවා (*Hystrix indica*), උගුඩුවා (*Paradoxurus hermabhroditus*), උනහපුලුවා (*Loris tardigradus*), උරුලෑවා (*Viverricula indica*), ඌරු මීයා (*Bandiota indica*), කලවැද්දා (*Paradoxurus hermabhroditus*), කොළ දිවියා (*Felis viverrina*), කොස්ඇට මීයා (*Mus musculus*), දඬුලේනා (*Ratufa macroura*), මාහම්බාවා (*Petaurista philippensis*) මාවවුලා (*Pteropus giganteus*), මීමින්නා (*Tragulus meminna*), මුගටියා (*Herpestes*), ලේනා (*Funambulus sp*), වල්ඌරා (*Susdomesticus*), වල්හාවා (*Lepus nigricollis*), වැලිමුවා (*Muntiacus muntjak*), හම්බාවා (*Petaurista petaurista*), හෝතඹුවා (*Herpestes edwardsii*) (චන්ද්‍රානන්ද,201:,73-74). උරග වර්ගයට අයත් විෂඝෝර සර්පයින් ද මෙහිදි හදුනාගන්නට හැකිවිය. ඇහැටුල්ලා (*Ahaetulla nasutus*), කබරගොයා (*Varanus sallvator*), ගැරඬියා (*Ptyas mucosus*), දියබරියා (*Exenochrophis piscater*), නාගයා (*Naja naja*), පලාපොළඟා (*Trimeresurus trigonocephalus*), පිඹුරා (*Python molurus*), පොල්මල් කරවලා (*Chrysopeleaornate*), පොළොං තෙලිස්සා (*Hypnale hypnale*), බෝදිළිමා (*Chamaeleo brookesia*), මල්කරවලා (*Balanophis ceylonesis*), හරකුක්කා (*Amphiesma stolata*), හාල්දණ්ඩා (*Dendre iaphis spp*), ගැඩවිලා (*Eudrillus*) (එම;75). ආත්‍රෝපෝඩා ගණයට අයත් සත්ත්වයින් ද හඳුනාගන්නා ලදී. කළු කුඹියා (*Formica nidificans*), දිමියා (*Ocecophylla smaragdina*), මීමැස්සා (*Apis mellifera*), රැහැයියා (*Cicada spp*), රැ බදුල්ලා (*Lampyris spp*), හරක් කිනිතුල්ලා (*Boophilus annulatus*), හෝ හපුටා (*Culex pipens*) (එම,75). මීට අමතරව ගොළුබෙලි විශේෂ කිහිපයක් ද හඳුනාගැනීමට හැකිවිය. (*Acavus superbus*), (*Paludomus sp*), ( *Achantina fulica*), ( *Aulopoma sp*). ප්‍රධාන ජල මූලාශ්‍රයක් වන ගුරුගොඩ ඔයෙහි කොරලියා (*Etroplus suratensis*), දණ්ඩියා (*Esomus thermoicos*), මඩ කනයා (*Ophiocephalus punctatus*) යන මත්ස්‍යයින් දක්නට ලැබේ (එම,2017,75-76). පක්ෂීන් විශේෂ රාශියක් ද මෙම ප්‍රදේශයෙන් හඳුනාගන්නා ලදී. ඇටි කුකුළා (*Centropus sinensis*) උලමා (*Bubo nipalensis*), කණකොකා (*Ardeola grayii*), කව්ඩා (*Dicrurus lophorhinus*), කළුකපුටා (*Corvus macrorhynchos*), කොණ්ඩ කුරුල්ලා (*Pyenonotius cafer*), කොවුලා (*Eudynamys scolopaceus*), දෙමලිච්චා (*Turdoides affinis*), නීලකොබෙයියා (*Chalcophas indica*), පැණි කුරුල්ලා (*Nectarinia lotenia*), මයිනා (*Acridotheres tristis*), ශ්‍රී ලංකා වැහිළිහිණියා (*Hirundo hyperythra*) වවුලා (*Cynopterus ssphinx*), පිළිහුඩුවා (*Halcyon pileata*), කොරවක්කා (*Amaurornis phoenicurus*) (එම,76-77). ඒ අනුව මෙහි ශාක සහ සත්ත්ව ප්‍රජාව අධ්‍යයනය කිරීමේදි විශාල ජෛව විවිධත්වයකින් යුත් පෙදෙසක් ලෙස පෙන්වා දිය හැකිය.

මෙම ගම්මානයේ ජනතාව පරිසරයත් සමඟ ඉතා දැඩි සම්බන්ධතාවයක් පවත්වා ඇත. ඒ අනුව ඔවුන්ගේ වගාවන්ට ස්වාභාවිකව සිදුවන හානි සහ රෝග සඳහා ඔවුන්ටම ආවේණික නාමයන් පාවිච්චි කරනු ලැබේ. කෙසෙල් බෝග වගාවේ දී සිදුවන රෝග සඳහා විවිධ නාමයන් භාවිත කර ඇත. **කහ රෝගය** යනුවෙන් ගොවියා හඳුන්වන්නේ සරුවට වැඩී තිබෙන කෙසෙල් අතුවල කහපාට මතුවෙලා පසුව සම්පූර්ණ ගසම කහපාට වී කෙසෙල් අතු කඩා වැටීමේ රෝගය වේ. එමගින් සම්පූර්ණම කෙසෙල් පඳුරුම විනාශ වේ. කෙසෙල් ගසේ මව් ගහෙන් එන **හොටි මැරීමේ රෝගය** ගැමි ජනතාව විසින් කඳ පණුවා විදීමේ රෝගය ලෙස හඳුන්වනු ලැබේ. එයම කෙසෙල්

**වඳබහිනවා** යනුවෙන් ද හඳුන්වයි. ගම්මිරිස් සහ බුලත් වැල්වලට යකඩ මළ රෝගය සෑදේ. එහිදී සිදු වන්නේ ගම්මිරිස් සහ බුලත් කොළයේ තැන් තැන්වල පුල්ලි සෑදීමයි. එසේම බුලත්වල කොළ අළු පාට වීම **අළු රෝගය** යනුවෙන් ගැමියන් හඳුන්වනු ලැබේ. ඊට අමතරව **පුරුක් ගැලවීමේ රෝගය** ද වේ. බුලත් සහ ගම්මිරිස් වැල් වල පුරුක් ගැලවීම මෙලෙස නම් කරයි. වර්තමානයේ තේ වගාවත් සමග බෝවන රෝග සඳහා ද විවිධ නාමයන් ගැමියන් විසින් භාවිත කරනු ලැබේ. තේ පැළ ළපටි කාලයේ දී බිම් පණු රෝගය සෑදේ. මෙහිදී සිදු වන්නේ තේ පැළ සිටුවීමෙන් පසු ගහේ මුල සිට පණුවා කාගෙනවිත් ගහේ මැද හරියට පමණ පණුවා පැමිණීමෙන් පසු තේ පැළය කඩා වැටේ. එය **බිම් පණු රෝගය** නම් වේ. ඩොලමයිට් පොහොර මෙය නැති කිරීම සඳහා ගැමියන් විසින් භාවිත කරයි. මෙම ගම්තුන ප්‍රදේශයේ සීත දේශගුණය වැඩි නිසා මීදුම සහිත කාලවලදී තේ දල්ල මතට මීදුම වැටීම නිසා තේ පත්‍ර මත බිබිලි දැමීමක් සිදු වේ. එය **සුදු පුල්ලි රෝගය** වේ.

ගම්තුන ගම්මානයේ මෙලෙස පැවති අතීත ස්වභාවික පරිසරය ආර්ථික බෝග වගාවත් සමඟ වෙනස් විය. ඒ අනුව පැවති ස්වාභාවික භූ දර්ශනය තේ වගාවේ ව්‍යාප්තියත් සමග විශාල වශයෙන් විවිධ වෙනස්කම්වලට භාජනය වූ අතර කඳු මුදුන්හි පිහිටි ස්වාභාවිකව වැඩී තිබූ විශාල ගස්වර්ග කපා පොළව සකසා තේ පැළ සාදන ලදී. තේ වගාවට සුදුසු දේශගුණික ලක්ෂණ මෙම ගම්මානයේ පවතින බැවින් දෝතල් ඔය ප්‍රදේශයේ තේ කර්මාන්තශාලාවක් ආරම්භ කර දෝතල් ඔය තේ වතුයාය පිහිටුවා ද්‍රවිඩ ජනතාව එම ප්‍රදේශයේ පදිංචි කරවන ලදි. එතෙක් මෙම ගම්මානයේ ජීවත් වූයේ සිංහල බෞද්ධ ජනතාව පමණි. ඉන්පසු ද්‍රවිඩ ජනතාව පදිංචි වූවායින් පසුව දෝතල් ඔය වතුයායේ ද්‍රවිඩ සංස්කෘතික අංග ද ඇති විය. ද්‍රවිඩ ජනතාවට අමතරව සිංහල ජනතාව ද තේ කර්මාන්ත ශාලාවේ දෛනිකව වැඩ කිරීමට සහභාගි විය. මීට අමතරව ගංතුන ග්‍රාමයේ අතීතයේ දී විශාල ඉඩම් තිබූ පිරිස පෞද්ගලිකව කුඩා තේ වතු වගාකර කුඩා පරිමාණයේ තේ වතු හිමියන් බවට පත්විය. දෛනිකව තේ කර්මාන්ත ශාලාවේ වැඩට ගිය ගැමි ජනතාව ද තමන්ගේ හේන් ගොවිතැන් කළ වගා බිම් අතහැර එම ප්‍රදේශවල ද ඔවුන්ගේ නිවාස අසල ද තේ පැළ සිටුවා ආර්ථික බෝග වගාවට යොමුවිය. ඒ අනුව මෙම ප්‍රදේශයේ පිහිටි ස්වාභාවික පරිසරය විනාශ වූ අතර පරිසරයේ තිබුණු ගස්, වැල් සහ සත්ත්ව ප්‍රජාවගේ ද අඩුවීමක් දක්නට ලැබිණ. එසේම දෝතල් ඔය ප්‍රදේශයේ තේ වගාවත් සමග විශාල වශයෙන් පයිනස් ගස් සිටුවන ලදී. ඊට පෙර මෙම ප්‍රදේශයේ පයිනස් ගස් නොතිබිණි.

මෙලෙස අතීත පරිසරය තේ වගාවත් සමඟ වෙනස් වීම නිසා එහි අහිතකර ප්‍රතිඵල අත්විඳින්ට සිදු වූයේ 2016 වසරේදීය. එනම් මානව ක්‍රියාකාරකම් නිසා භූමිය අස්ථාවරත්වයට පත්විය. ඒ අනුව මෙම ප්‍රදේශයේ ස්ථාන කිහිපයක් නායගිය අතර තවත් ස්ථාන කිහිපයක් නායයාමේ තර්ජනයට ලක්ව පවතී. ගංතුන ග්‍රාමයේ සහ ඒ අවට ප්‍රදේශ වන සාමසර කන්ද, එළගපිටිය නායයෑම් පිළිබඳ අධ්‍යයනය කළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ ගර්භ විද්‍යා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානි ආචාර්ය ජගත් ගුණතිලක සහ භූ ගර්භ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංජීව මලවිආරච්චි පෙන්වාදෙන ආකාරයට මෙම නායගිය කොටස්වල දැඩි අවධානයට ලක් වූ විශේෂ සාධකයක් වූයේ එම නායගිය කොටසේ තිබූ තේ වගාව ක්‍රමවත් ජලවහන පද්ධතියකින් තොරව සිදුවන්නට ඇති බවය. එම තේ වගාව සම්පූර්ණයෙන්ම නායට හසුව තිබූ අතර එම වගාව දෙපස කොටස නිරුපද්‍රිතව ඇති බව දක්නට ලැබිණි. එම නිරුපද්‍රිත කොටසේ ස්වාභාවික ජලවහනය හොඳින් සිදුවීමත්, තේ වගා කොටසේ ස්වාභාවික ජලවහනය වෙනස් කරනු ලැබ තිබීමත් මෙයට මූලිකම හේතුව විය (cea.nsf.ac.lk.2016).

දින කිහිපයක් තුළ ඇද හැලෙන අධික වර්ෂාව හරිහැටි පොළව මතුපිටින් ගලා යෑමට ඉඩ සැලසී නැතිවිට විශාල ජල ප්‍රමාණයක් අභ්‍යන්තරයට කිඳා බැස මවු පාෂාණයේ ස්වාභාවිකව පිහිටා ඇති පැලුම් හෙවත් කුස්තුර ප්‍රසාරණයට ඉතා විශාල ලෙස බලපානු ලැබේ. එබැවින් ක්‍රමවත් ජලවහන පද්ධතියක් ඇති නොකර නොයෙක් අරමුණු

සඳහා බිම් සකස් කිරීම විශේෂයෙන්ම අධික බෑවුම්වලට යෝග්‍ය නොවේ. මෙලෙස ස්වාභාවිකව පැවති පරිසරය සහ ජලවහන රටා මානව ක්‍රියාකාරකම් නිසා වෙනස් වීමෙන් මෙවැනි ආපදා තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවේ. අතීත ස්වාභාවික පරිසරය වෙනස් වීම සඳහා බලපාන සාධක කිහිපයක් මෙලෙස පෙන්වාදිය හැකිය.

- ජනගහනය වැඩි වීමත් සමග නුසුදුසු ස්ථානවල නිවාස ඉදිකිරීම.
- විශාල ගස් වර්ග කපා දැව අවශ්‍යතා පිරිමසා ගැනීම සහ ශාඛ කඳන් විකිණීම.
- අක්‍රමවත් මාර්ග පද්ධති ඉදිකිරීම.
- කුඹුරු ඉඩම් ගොඩකිරීම.

මීට අමතරව කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉදිකිරීම මඟින් ද ස්වාභාවික පරිසරයේ වෙනස්කම් සිදුවිය. ගුරුගොඩ ඔයෙහි වේලි බැද ජල මාර්ග හරස්කර ජල විදුලි බලාගාර 2ක් ඉදිකර ඇත. මෙවැනි මානව ක්‍රියාකාරකම් නිසා අතීතයේ පැවති ශාක සහ සත්ත්ව ප්‍රජාව අතරින් විශාල ප්‍රමාණයක් වර්තමානයේ දක්නට නොලැබේ. එසේම ගුරුගොඩ ඔයෙහි ජල ප්‍රමාණය පවා අඩු වීමක් දක්නට ඇත. කුඹුරු ඉඩම්වල තේ, කෙසෙල්, මඤ්ඤොක්කා ආදි වගාවන් සිදු කරනු ලැබේ. අතීතයේ පැවති කුඹුරු ඉඩම් සියල්ලම වගා නොකර අත්හැර ඇත. ඖෂධීය බෙහෙත් පැළෑටි වඳවීමේ තර්ජනයට ලක්වෙමින් පවතී.

## නිගමනය

වර්තමානයේ දී මෙහි වෙනස් වී ඇති පාරිසරික ලක්ෂණ අධ්‍යයනයේදී ගුරුගොඩ ඔයෙහි ගලා යෑම සමහර ස්ථානවලින් වෙනස් වෙමින් පවතී. එසේම මෙම ගම්මානයේ කුඩා කුඩා ජල මූලාශ්‍ර සිඳී ගොස් ඇත. අතීතයේ සිට මානව ජනාවාසකරණය වූ මෙම ප්‍රදේශයේ ජනගහන ව්‍යාප්තිය ක්‍රමයෙන් වැඩි වී වර්තමානය වන විට පවුල් සංඛ්‍යාව 1100ක් තරම් පහළ මට්ටමක පවතී. විශේෂයෙන්ම ස්වාභාවික ආපදානිසා මෙම ප්‍රදේශයේ වෙසෙන ජනතාව නගරයට සංක්‍රමණය වී එම ප්‍රදේශවල ස්ථිර පදිංචි පිහිටුවා ගැනීම ගංතුන ගම්මානයේ ජනතාව අඩු වීමට ප්‍රධාන හේතු සාධකය විය. මේ සියලු කරුණු සලකා බැලීමේදී අතීත පරිසරය වෙනස් වීම නිසා මෙහි වෙසෙන ජනතාවගේ ජන ජීවිතය ද වෙනස් වී ඇත.

සැලකිය යුතුයි: කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙහි බොහෝ කරුණු සාකච්ඡා කර ඉදිරිපත් කර ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


චන්ද්‍රානන්ද හිමි, මන්දාරම්නුවර, 2017, ***රිටිගල උරුමය***, තරංජි ප්‍රින්ටර්ස්, හයිලෙවෙල් පාර, මහරගම

සෝමරත්න, ආර්.පී., 2014, ***මෙහෙවර***, වසන්ත ඇඩ්වර්ටයිසින් ඇන්ඩ් ෆොටෝ, මාවනැල්ල.


## සම්මුඛ සාකච්ඡා

කැළුම් ජයසිංහ මහතා සමග ගංතුන උඩගම ග්‍රාම නිලධාරී කාර්යාලයේදී 2020 මැයි 15 දින සම්මුඛ සාකච්ඡාව.

වයි. පී. ජයසේන මහතාගේ නිවසේ සිට 2020 මැයි 10 දින සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාව.

ජ්‍යෙෂ්ඨ පුරවැසි පී. ආර්. නිමල් සුරවීර මහතාගේ නිවසේ සිට· 2020 මැයි 05 දින සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාව.

ආර්. ඒ. සෝමරත්න මහතාගේ නිවසේ සිට 2020 මැයි 08 දින සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාව.

සංවර්ධන නිලධාරි එස්. නදිකා පුෂ්ප කුමාරි මිය සංවර්ධන නිලධාරි කාර්යාලයේ දී 2020 මැයි 15 දින සම්මුඛ සාකච්ඡාව.